# ජාතික අධ්‍යාපන ආයතනය

# අයදුම්පත් කැඳවීම

# විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2025

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

දරුවන්ගේ දෘෂ්ටි දුනතා, ශ්‍රවණ ඌනතා, කායික දුබලතා, බුද්ධිමය දුබලතා, ඕටිසම් තත්ත්වය හා වෙනත් ඉගෙනුම් දුෂ්කරතා නිසා මතුවන ඉගෙනීමේ ගැටලු ඇතුළත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හඳුනාගෙන ඔවුන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබා දීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලාවක් වේ. අධ්‍යයන සැසි මාර්ගගත ක්‍රමය ඔස්සේත්, ජාතික අධ්‍යාපන ආයතනයේදීත්, ප්‍රායෝගික සැසි තෝරා ගත් ආයතනවලදීත් පැවැත්වේ. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (Sri Lanka Qualification Framework- SLQF) තුන්වන මට්ටමට (Level 3) අයත් පාඨමාලාවක් ලෙස උක්ත පාඨමාලාව සංවිධානය කර ඉදිරිපත් කෙරේ.

**පාඨමාලා කාලය** - සතිඅන්ත එක් අවුරුදු පාඨමාලාවකි

**පාඨමාලා මාධ්‍යය** - සිංහල

**අයදුම්කිරීම සඳහා සුදුසුකම්**

2025-11-15 වන දිනට වයස අවුරුදු 55 ට අඩු අයෙකු වීම

**අ. පො. ස. (උ. පෙළ )** සමත් වීම

**සහ**

රජයේ හෝ රජයේ අනුමත පාසලක හෝ පිරිවෙනක ගුරුවරයකු වීම

**හෝ**

ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක / ගුරු විද්‍යාලයක ගුරු අධ්‍යාපනඥයකු වීම

**හෝ**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු වීම

**හෝ**

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වීම හෝ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ පාසලක / ආයතනයක සේවයේ යෙදී සිටින්නකු වීම

**පාඨමාලාවට තෝරා ගැනීම** - ලිඛිත පරීක්ෂණයක්, සම්මුඛ පරීක්ෂණයක් යන දෙකම හෝ ඉන් එකක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**පාඨමාලා ගාස්තු**

| | **ගාස්තු** |
|---|---|
| අයදුම්පත් ගාස්තුව | 200.00 |
| ලියාපදිංචි ගාස්තුව | 1,000.00 |
| පාඨමාලා ගාස්තුව | 50,000.00 (වාරික 2 කින් ගෙවිය හැකි ය) |

✓ සියලුම ගෙවීම් බැංකු කාඩ්පත් මගින් (Credit හා Debit) සිදු කළ හැකි ය

**අයදුම් කළ යුතු පිළිවෙළ**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස **https://www.exams.nie.lk/intakes/new** යොමුව ඔස්සේ මාර්ගගතව පමණක් අයදුම්පත්‍ර යොමු කළ යුතුය. මාර්ගගතව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබා ගත හැකිය. **https://www.exams.nie.lk/info/applying-for-new-enrollments**

**විමසීම්** - අයදුම්පත්‍ර යොමු කිරීමේ දී ඇතිවන ගැටලු සඳහා – (0117601776/0117601777)

පාඨමාලාව පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා – (0117601657/0117601659/0117601661/0117601662)

අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය **2025.11.15**

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.**
**2025.09.24**

අයදුම් කිරීමේ මාර්ගෝපදේශය සඳහා
මෙම QR Code එක Scan කළ හැකි ය.

tamilguru.lk